**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2018**

---------------------------------------------------------------------------

## 1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ (මණ්ඩලය) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ

වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත - 12 (1) (ආ) (v) වගන්තිය | ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් ඉදිරිපත් කරනු ලබන නම්වලින් මූල මණ්ඩලයකින් තෝරා ගනු ලබන තැනැත්තෙකු මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා පත් කළ යුතු වුවද, සම්මේලනය විසින් එම නම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මේ දක්වා එම සාමාජිකයා පත් කර නොතිබුණි. | නම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා තැනැත්තෙකු පත් පත් කර නොතිබුණි. | මණ්ඩලය විසින් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනතේ ප්‍රතිපාදනවලට අනුකූල විය යුතු වීම. |
| (ආ) | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත - 12 (1) (ආ) (vii) වගන්තිය | මණ්ඩලයේ විෂය පථය යටතට වැටෙන විශ්ව විද්‍යාලවල ගණකාධිකරණය, ව්‍යාපාර කළමණාකරණය හෝ ව්‍යාපාර පරිපාලන අංශ, පීඨ සහ පශ්චාත් උපාධි ආයතන නියෝජනය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන | මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන තැනැත්තෙක් පත් කළ යුතු වුවද, 2015 සිට 2019 දක්වා කාල සීමාව තුළ එසේ නම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් සාමාජිකයා පත් කර | මණ්ඩලය විසින් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනතේ ප්‍රතිපාදනවලට අනුකූල විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | තැනැත්තන් තුන්දෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින් තෝරා ගනු ලැබූ එක් තැනැත්තෙක් මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා පත් කළ යුතු වුවද, මේ දක්වා එම සාමාජිකයා පත් කර නොතිබුණි. | නොතිබුණි. | |
| (ඈ) | චක්‍රලේඛ අංක පීඊඩී/12 - යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ - ඡේද අංක 9.6 | විධිමත් කාර්යසාධන ඇගයීමේ පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. | මණ්ඩලය විසින් සඳහන් කරන ලද යෝජනා සහ සංශෝධිත අනුව කාර්යසාධන ඇගයීම් පත්‍රිකාව වෙනස්කම්වලට පත් කරමින් පැවතීම. | මණ්ඩලය විසින් අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. |
| (ඈ) | චක්‍රලේඛ අංක පීඊඩී/12 - යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ - ඡේද අංක 9.14 | මණ්ඩලය විසින් විගණිත දිනය තෙක් ක්‍රියාපටිපාටි අත්පොතක් අනුමත කර නොතිබුණි. | එම කාර්ය පරිපාටි අත්පොත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට පෙර මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරි රැස්වීම් වාරයකට ඉදිරිපත් කරනු ලැබේ. | මණ්ඩලය විසින් අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. |
| (ඉ) | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 - ඡේද අංක 4 | මණ්ඩලය විසින් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාර, 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාළ ලේඛණ 2019 මැයි 30 දින ඉදිරිපත් කර ඇත. | මණ්ඩලය විසින් අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ ප්‍රධාන ආදායම රජයේ ප්‍රදාන වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 7,285,819 කින් එනම් සියයට 08 කින් වැඩි වී තිබුණි. කෙසේ වුවද, ජාත්‍යන්තර සාමාජිකත්වයන් සහ පුහුණු හා සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වූ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 46 කින් සහ සියයට 144 කින් සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මහල කාර්යාල කටයුතු සඳහා භාවිතා කිරීමට මණ්ඩලය විසින් සිලෝන් බයිබල් හවුස් සමඟ 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 04 ක කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා කුලිය ලෙස රු. 4,149,492 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අපේක්ෂිත අරමුණු සඳහා එම මහල යොදා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර කාර්යාලයේ අභ්‍යන්තර ඉදිකිරීම් මේ දක්වා ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලවීම් සමීක්ෂණය සඳහා අතිරේක නිලධාරීන් බඳවාගැනීමට මණ්ඩලය විසින් අපේක්ෂා කළ බැවින්, අතිරේක නිලධාරීන් යෙදවීම සඳහා මණ්ඩලය විසින් අතිරේක මහලක් පවතින කාර්යාල පරිශ්‍රයක් සොයමින් පැවතුණි. ආසන්න ඉඩමේ උස් ගොඩනැගිල්ලක සිදුකරන ඉදිකිරීම්වලින් බාධා පැමිණීම හේතුවෙන් පළමු මහලේ අභ්‍යන්තර ඉදිකිරීම් වැඩ 2017 වර්ෂයේ පළමු මාසවල ප්‍රමාද වීම. | වියදම් ආර්ථිකභාවයකින් හා කාර්යක්ෂමව දැරිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලය සඳහා කළමණාකරණ තොරතුරු පද්ධතියක් අධ්‍යයනය, සැලසුම් කිරීම, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජූනි 03 දින ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද, එය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය ප්‍රදානය කිරීම සිදුකරන විට, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ පවතින අයවැය බාධක හේතුවෙන් සේවාව ඉටුකළ නොහැකි බව දන්වන ලදී. | විධිමත් කළමණාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කල යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත අනුව, මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ, නිශ්චිත ව්‍යාපාර ආයතන මඟින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීමයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිශ්චිත ව්‍යාපාර ආයතන ප්‍රමාණය හඳුනා ගැනීමට මණ්ඩලය විසින් උචිත යාන්ත්‍රණයක් හඳුන්වා දී හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2007 අංක 07 දරන නව සමාගම් පනත බලාත්මක වීමත් සමඟ සමාගම්වල ගිණුම් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් පෞද්ගලික මූල්‍ය සමාගම්වල මූල්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. එම නිසා සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගෙන් තොරතුරු ලබාගැනීමට නොහැකි වී ඇත. | උචිත යාන්ත්‍රණයක් හඳුන්වාදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව විගණනය විසින් ඉල්ලීම් කළ තොරතුරු සැපයීම සඳහා ගිවිසුම්ගත ගාස්තුව රු. 75,000 + වැට් බදු සහ සත්‍ය වියදම ප්‍රතිපූරණය කිරීමේ පදනම මත මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකවරුන් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම තොරතුරු 2019 මැයි 09 දින ඉදිරිපත් කළද, එය අපේක්ෂිත මට්ටමට නොවීය. ප්‍රධාන මෙහෙයුම් කටයුතුවලට අදාල විශ්ලේෂණයන් සඳහා අවශ්‍ය තොරතුරු කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් මණ්ඩලය සතුව නොපැවතුණු බව නිරීක්ෂණය විය. | සවයංක්‍රීය පද්ධතියක් තුළින් එම තොරතුරු ලබාගැනීමට නොහැකි වීම නිසා එක් එක් ලිපිගොනු පරීක්ෂාකර ලබාගැනීමට සිදු වීම. | ප්‍රධාන මෙහෙයුම් කටයුතුවලට අදාල තොරතුරුවලට ඉක්මනින් ප්‍රවේශ වීමට හැකි වන පරිදි මණ්ඩලය විසින් එම තොරතුරු පවත්වා ගත යුතුවීම. |
| (ඇ) | මණ්ඩලය විසින් සමහර නිශ්චිත ව්‍යාපාර ආයතන සමඟ මේ වනවිටත් සන්නිවේදනය කර තිබූ සොයාගැනීම් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. | එම නිරීක්ෂණවලට අනුකූලවීම හුදෙක් ඔවුන්ගේ කැමැත්ත මත සිදු වන බවත්, අදාල ආයතන විසින් ප්‍රතිචාර දැක්වීම ධෛර්යමත් කිරීම තුළින් අනුකූලවීම් වර්ධනය කිරීමට ඔවුන්ව පෙළඹවීමේ වක්‍ර මිනුමක් ලෙස ප්‍රතිපෝෂණ පෝරම හඳුන්වා දී තිබුණද, එම ප්‍රතිපෝෂණ පෝරම සඳහා නිශ්චිත ව්‍යාපාර ආයතන විසින් ප්‍රතිචාර දැක්වීම අත්‍යවශ්‍ය නොවීම. | මණ්ඩලය විසින් පසුවිපරම් කටයුතු සිදු කළ යුතු වීම. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 11 ක් පැවති අතර ඉන් පුරප්පාඩු 08 ක් ජොෂ්ඨ මට්ටමේ විය. | ඉහළ වැටුපක් යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු බඳවාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. බඳවාගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. | පුරප්පාඩු පිරවීම හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කළ යුතු වීම. |
| (ආ) | මීට අමතරව, මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019 අප්‍රේල් 24 දින සිට පුරප්පාඩු විය. | එම තනතුර සඳහා පවතින වැටුප් පරිමාණය තාක්ෂණික දැනුමැති ජොෂ්ඨ වරලත් ගණකාධිකාරීවරයෙකු සඳහා වෙළඳපලේ පවතින වැටුපට වඩා පහළ මට්ටමක් බැවින් ඒ යටතේ සුදුසු අයදුම්කරුවකු බඳවා ගැනීමට නොහැකි වීම. | අධ්‍යක්ෂ ජනරාල් තනතුර හැකි ඉක්මනින් පිරවිය යුතු වීම. |
| (ඇ) | මණ්ඩලයේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ ජොෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීම් සිදු කර තිබුණි. | මෙම ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා අනුමත වැටුප් පරිමාණය යටතේ අවශ්‍ය අත්දැකීම් සහිත තාක්ෂණික දැනුමැති ජොෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් බඳවා ගැනීමට නොහැකි වීම. | කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම් සඳහා අනුමැතිය ලබාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට පරිබාහිරව කොන්ත්‍රාත් පදනමින් බඳවාගන්නා ලද නිලධාරීන් දෙදෙනෙකුට ඉහළ වැටුපක් සහ වෙනත් ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | මෙම ස්ථීර කාර්ය මණ්ඩලය සඳහා අනුමත වැටුප් පරිමාණය යටතේ අවශ්‍ය අත්දැකීම් සහිත තාක්ෂණික දැනුමැති ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා බඳවා ගැනීමට නොහැකි බැවින් කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන තිබුණි. | වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ ගෙවීම සඳහා අනුමැතිය ලබා ගත යුතු වීම. |